ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම.	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ගොඩනැගිලි වටිනාකම රු. මිලියන 15.6 ක් අඩුවෙන් ගිණුම්ගත කිරීම, ව්‍යවහාරික විද්‍යා පීඨ ඉඩමේ ගොඩනැගිලි ඉදිකිරීමට අදාළව දරා තිබුණු රු. මිලියන 2.38 ක් ඉඩම් ලෙස දක්වා තිබීම, වාහන වටිනාකම රු. මිලියන 5.1 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම සහ සේවක භාරකාර අරමුදල් දායකත්ව මුදල් ගෙවීමේදී රු.මිලියන 2.826 ක් දෙවතාවක් ගිණුම්ගත කිරීම යන පූර්ව වර්ෂ ගිණුම්කරණ වැරදි ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 47 ඡේදය ප්‍රකාරව අතීතානුයෝගීව නිවැරදි කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරීමට කටයුතු කර තිබුණි.	දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රයේ ගොඩනැගිලි වටිනාකම රු.මිලියන 15.6 ක් අඩුවෙන් ගිණුම්ගත කර නොමැති අතර රු.මිලියන 2.38 ක මුදල ගොඩනැගිල්ල ඉදිකිරීමට ප්‍රථම ඉඩමේ තිබූ වල සහිත ප්‍රමාණය පුරවා සකස් කිරීමට අදාළ වියදමක් වූ බැවින් එය ඉඩමේ සංවර්ධන වියදමකි. එය ඉඩමේ වටිනාකම වැඩිවීමකි. සේවක භාරකාර අරමුදල් ගෙවීම සඳහා ලියන ලද රු.මිලියන 2.826 ක පළමු ගෙවීම නැවත අදාළ ගිණුමට බැරකර නිවැරදි කර ඇති බව.	පූර්ව වර්ෂ ගිණුම්කරණ වැරදි මූල්‍ය ප්‍රකාශන ප්‍රතිශෝධනය කර අතීතානුයෝගීව නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 13 සහ 69 ඡේදයට පටහැනිව විශ්වවිද්‍යාලය විසින් 2023 නොවැම්බර් සිට භාවිතා කරමින් පවතින රු.මිලියන 209.8 ක මළාපවහන සහ අපජල පිරිපහදු පද්ධතිය දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කිරීමකින් තොරව කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබීම	2023 වර්ෂයේ නොවැම්බර් සිට මෙම මළාපවාහන සහ අපජල පද්ධතිය විශ්වවිද්‍යාලයේ පාවිච්චිය සඳහා යොදාගනු ලැබුවද, මෙම ව්‍යාපෘතිය ඉදිකළ කොන්ත්‍රාත්කරු විසින් එහි අවසන් බිල්පත ගෙවීම සඳහා ඉදිරිපත් කර ව්‍යාපෘතිය	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළ යුතුය.

	හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ හා කෙරීගෙන යන වැඩ එම අගයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයට අදාළ රු.මිලියන 20.9 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.	විශ්වවිද්‍යාලයට භාරදෙන තෙක් වත්කම් ලෙස ගිණුම්ගත කිරීමේ හැකියාවක් නැති බව.	
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 7 හි 65 ඡේදයට අනුව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු.මිලියන 1,119.97 ක වත්කම් පන්ති 7 ක් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.	විශ්වවිද්‍යාලයේ ස්ථාවර වත්කම් අයිතම 85,000 ක් පමණ ඇති අතර සීමිත කාර්ය මණ්ඩලයක් සමඟ පහසුවෙන් මෙම කාර්යය සිදු කළ නොහැකි බව.	-එම-
(ඈ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 117 ඡේදයට පටහැනිව රු.මිලියන 297.77 ක් වූ ප්‍රාග්ධන සංචිත 04 ක් 2024 දෙසැම්බර් 31 දින වන විටත් රඳවා ගැනීමේ ලාභයට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම රු. මිලියන 218.4 ක මුදල 2019 වර්ෂයේ කෘෂි පීඨයේ නව වගාබිම අත්පත් කර ගැනීම සඳහා භාණ්ඩාගාරයෙන් ලද මුදල වන අතර එය ප්‍රාග්ධන සංචිත යටතේ පෙන්වා ඇත. එය 2025 වසරේ පොදු සංචිතයට මාරු කරනු ඇත. ඉතිරි මුදල් භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ සහ තාක්ෂණ පීඨ ඉදිකිරීම් සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ ලද මුදල් බවත් තවමත් වියදම් නොකළ බැවින් ප්‍රාග්ධන අරමුදල් යටතේ පෙන්වා ඇති බව.	-එම-
(ඉ)	විදේශ ව්‍යාපෘතියක් මඟින් ඉදිකර සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය වෙත භාර දී තිබුණු වටිනාකම රු. මිලියන 4,370.57 ක් වූ නව තාක්ෂණ පීඨ ගොඩනැගිල්ල සහ බස් රථ දෙකත් සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලය වෙත ලැබී තිබුණු භාණ්ඩාගාර හා වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන එකතුව රු. මිලියන 128.48 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 හි 42 හා 44 ඡේදවලට අනුව වත්කම් සහ වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කර	ප්‍රමිතියේ 14 (ආ) ඡේදය අනුව වත්කමේ වටිනාකම විශ්වාසදායි ආකාරයට තීරණය කළ නොහැකි බැවින් මෙම ගොඩනැඟිලි වත්කම් ලෙස ගිණුම් ගත කිරීමේ හැකියාවක් නැත. අදාළ බස් රථ දෙක විශ්වවිද්‍යාලයේ නමින් ලියාපදිංචි කර ඇතත් ඒවායේ වටිනාකම් මෙතෙක් විශ්වවිද්‍යාලයට ලිඛිතව භාරදී නොමැති අතර එසේ ලබාදෙන තෙක් ඒවා ගිණුම් පොත්වලට	-එම-

	නොතිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් අඩුවෙන් හා ඌනතාවය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබුණි.	ලබාගැනීමේ හැකියාවක් නොමැත. භාණ්ඩාගාර හා වෙනත් ප්‍රාග්ධන ප්‍රදාන මුදල් අදාළ අරමුණු සඳහා වියදම් කළ යුතු අතර ආදායමට ලබාගැනීම සිදුකළ නොහැකි බව.	
(ඊ)	2020-2023 කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලයට විදේශ ව්‍යාපෘතියක් මඟින් ලබා දී තිබුණු වටිනාකම රු. මිලියන 428.97 ක් වූ වත්කම්, අදාළ වත්කම් ලද වර්ෂය අනුව ගිණුම්ගත කිරීමකින් තොරව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 අනුව සමාලෝචිත වර්ෂය තුළ හුවමාරු නොවන ගණුදෙනුවලින් ලද ආදායමක් ලෙස හා එම වත්කම්වලට අදාළ රු. මිලියන 214.63 ක් වූ සමුච්චිත ක්ෂය සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙසත් ගිණුම්ගත කර තිබුණි. මේ හේතුවෙන් එම වත්කම්වල ශුද්ධ අගය වූ රු. මිලියන 214.34 කින් වර්ෂයේ ඌනතාවය අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ව්‍යාපෘතිය අවසන් වන තෙක් එම වත්කම් අයත්වන්නේ ව්‍යාපෘතියට බැවින් විදේශ ව්‍යාපෘතියෙන් ලද මෙම වත්කම් පෙර වර්ෂවල සටහන් යටතේ හෙළිදරව් කර තිබුණි. ව්‍යාපෘතිය අවසානයේදී ආරම්භයේ සිට මිලට ගත් සියලු වත්කම් තොග (Inventory) පරීක්ෂා කර ලේඛන සකස් කර ඒවායේ පිරිවැය සමාලෝචිත වර්ෂයේදී ගිණුම් ගත කිරීමට කටයුතු කළ බව	වත්කම් ලද වර්ෂ පදනම්කරගෙන අතීතානුයෝගීව මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2016 වර්ෂයේදී රු.මිලියන 11.2 ක් වැය කර පවරාගෙන තිබුණු නිල නිවාස 16 ක් ගොඩනැඟිලි ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ඉඩම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ඉඩම් හා ගොඩනැඟිලි වටිනාකම එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. ඊට අදාළ රු.560,000 ක් වූ වාර්ෂික ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.	2016 වර්ෂයේ පොලිස් මූලස්ථානය වෙත රු.මිලියන 11,2 ක මුදලක් ගෙවීමෙන් පසු පොලිස් නිල නිවාස 16 ක් සහිත භූමිය පවරාගෙන ඇත. පවරාගන්නා අවස්ථාව වන විට ඉදිකර තිබූ මෙම නිවාස 16 භාවිතයට ගත නොහැකි අබලන් තත්ත්වයේ තිබී ඇත. ඒ අනුව ඒවායේ වටිනාකමක් නැති බැවින් ගෙවූ මුදල මෙම ඉඩම අත්පත් කර ගැනීමට වියදම් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිවැරදි බව.	අදාළ ඉඩම මේ දක්වා පවරා ගෙන නොමැති අතර මුදල් ගෙවා ඇත්තේ නිල නිවාස පවරා ගැනීමට බැවින් ගොඩනැඟිලි ලෙස ගිණුම්ගත කළ යුතුය. නිල නිවාස අබලන් වී තිබේ නම් හානිකරණ අලාභ සඳහා වෙන්කිරීම් කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	2012-2016 කාල සීමාවේදී නොමිලේ පවරා දී තිබුණු රජයේ ඉඩම් 6 ක් 2023 වර්ෂයේදී රු. මිලියන 1269.82 කට තක්සේරු කර ගිණුම්ගත කිරීමේදී ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමකින් තොරව ප්‍රත්‍යාගණන සංචිතයක් ලෙස ගිණුම් ගත කර තිබුණි.	මෙම ඉඩම් විශ්වවිද්‍යාලයේ ආරම්භයේ සිටම ගිණුම් පොත්වල ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. නමුත් අදාළ ලියවිලි සකස් කිරීමෙන් පසුව විශ්වවිද්‍යාලයට අයත් මෙම ඉඩම් මේ වන විට තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් අගය කර ගිණුම් ප්‍රකාශනවලට ගෙන ඇති බව.	ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

(ඈ)	බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද කථිකාචාර්යයවරුන් ඇතුළු නිලධාරීන්ගෙන් අයවිය යුතු එකතුව රු.මිලියන 138.71 ක් ගිණුම්ගත කර නොතිබුණි.	ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කරන දින වනවිට මෙම කථිකාචාර්යවරු 11 දෙනාගේ බැඳුම්කර කඩකිරීම සම්බන්ධයෙන් අවසාන අනුමැතිය පාලක සභාව වෙත ඉදිරිපත් කර නැත. ගිණුම් ප්‍රකාශවලට ගනු ලබන්නේ පාලක සභා අනුමැතියෙන් පසුව වන බැවින් මෙම නිළධාරීන් 11 දෙනාගේ බැඳුම්කර කඩකිරීම 2025 වර්ෂයේදී ගිණුම් ප්‍රකාශන වලට ගන්නා බව.	බැඳුම්කර ගිවිසුම් කඩකල දින අනුව මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් යටතේ සමාලෝචිත වර්ෂය තුළ උපයා ගෙන තිබුණු රු.මිලියන 159.2 ක ආදායම් සහ රු. මිලියන 71.6 ක වියදම් වලින් සමාලෝචිත වර්ෂයට අදාළ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව රු.මිලියන 39.03 ක් ආදායම් සහ වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ගලපා තිබුණි.	බාහිර පාඨමාලා සම්බන්ධයෙන් ගිණුම් තැබීම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 4/2016 හි උපදෙස් අනුව සිදුකරනු ලබයි. එම චක්‍රලේඛයේ 5.5 යටතේ ගිණුම් තැබිය යුතු ආකාරය පැහැදිලිව සටහන් කර ඇති බව.	ස්වයං මූල්‍ය උත්පාදන ක්‍රියාකාරකම් වලින් උපයන ආදායම් සහ ඊට අදාළ වියදම් උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමට කටයුතු කළ යුතුය.
(ඉ)	2024 දෙසැම්බර් 31 දිනට තොග ශේෂය මූල්‍ය ප්‍රකාශන හා තොග සමීක්ෂණ වාර්තා අනුව සැසඳීමේදී රු.මිලියන 6.68 ක නොසැසඳීමක් පැවතුණි.	මෙම වෙනස සොයා සන්සන්දනය කරන ලෙස ගබඩා පරිපාලන කටයුතු භාරව සිටින සැපයුම් අංශය වෙත දැනුම් දී ඇති බව.	අදාළ වෙනස්කම් සඳහා හේතු හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රත්‍යාගණන හා පොදු සංචිතයට සිදු කරන ලද පිළිවෙලින් රු.මිලියන 17.01 ක සහ රු.මිලියන 22.26 ක ගැලපීම් සම්බන්ධයෙන් අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	ගණුදෙනු විශාල ප්‍රමාණයක් මෙම වෙනස සඳහා හේතු වන බැවින් ඒ සියලු ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමේ ප්‍රායෝගික හැකියාවක් නැති බව.	මූල්‍ය ප්‍රකාශනවල සිදුකරන ගැලපීම්වලට අදාළ විස්තර මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(උ)	සමාලෝචිත වර්ෂය තුළදී හා ඉකුත් වර්ෂ 03 කදී විශ්වවිද්‍යාලයේ බැංකු ගිණුම් 02 කට සෘජුව බැරකර තිබුණු එකතුව රු. මිලියන 1.84 ක් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විවිධ තැන්පතු යටතේ දක්වා තිබුණි.	බැංකු ගිණුම්වලට විවිධ කාරණා සඳහා මුදල් තැන්පත් කිරීම් කරනු ලබයි. එම තැන්පත් සෘජු බැංකු ගතකිරීම් බැවින් ඒවා හඳුනාගන්නා තෙක් මෙම තැන්පතු ගිණුමේ සටහන් කර තබනු ලැබේ. වසර දෙකකට පමණ පසු මේවා ආදායමට ගැනීමට කටයුතු කරනු ලබන බව	බැංකුවට සිදුකරන සෘජු බැර කිරීම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වන වගන්තිය	අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව විශ්වවිද්‍යාලය විසින් රු.මිලියන 404.18 ක් ස්ථාවර තැන්පතු හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.	ස්ථාවර තැන්පතු සහ භාණ්ඩාගාර බිල්පත් වල කරන ලද ආයෝජන මුදල් සඳහා අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට මුදල් අමාත්‍යාංශය වෙත යොමුකර ඇති බව.	මුදල් පනතේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ආ)	1980 අංක 46 දරන සේවා නියුක්තියන්ගේ භාර අරමුදල් පනතේ 16 සහ 1982 අංක 03 දරන සේවා නියුකතියන්ගේ භාර අරමුදල් (සංශෝධිත) පනතේ 27 වගන්ති	සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා අදාළ දායක මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් විශ්වවිද්‍යාලය විසින් 2024 වර්ෂය තුළ රු. මිලියන 1.105 ක අධිභාර ගෙවා තිබුණි.	සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා දායක මුදල් නිසි පරිදි ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සේවක භාර අරමුදලට රු. මිලියන 1.105 ක අධිභාර ගෙවීමට දන්වන ලදි. මෙය මාස 03 ක ප්‍රේෂණවලට අදාළව අධිභාරයක් බව.	පනතේ විධිවිධාන අනුකූලව දායක මුදල් අදාළ කාලසීමාව තුළ ගෙවිය යුතු අතර අධිභාර ගෙවීමට හේතු සහ ඊට වගකිව යුතු නිළධාරීන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය පරීක්ෂණ කිරීමට කටයුතු සිදුකළ යුතුය.
(ඇ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඇ) සහ 38 (2) වගන්ති	එක් එක් අස්ථිත්වයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳ කලින් කල ලිඛිතව සමාලෝචනය සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, විශ්වවිද්‍යාලය විසින් එසේ සිදු කර නොතිබුණි.	මෙම කටයුත්ත ඉදිරියේදී සිදු කරන බව.	ජාතික විගණන පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඈ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 5 වන වගන්තිය සහ 2019 නොවැම්බර් 25 දිනැති අංක 09/2019 දරන	යොමුගත රෙගුලාසි ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් නිවාස කුලී අය නොකිරීම හේතුවෙන් පවුල් ඒකක නිල නිවාසවල පදිංචිකරුවන් 36 දෙනෙකුගෙන් 2023 සහ 2024 වර්ෂවලට අදාළව රු. මිලියන 6.76 ක්	මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් විමසූ අවස්ථාවේ රජරට විශ්වවිශ්වවිද්‍යාලය දුෂ්කර ප්‍රදේශයක පිහිටා ඇති	ආයතන සංග්‍රහයේ විධිවිධානවලට හා චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය.	අයකර නොතිබුණි. තවද තනි ඒකක නිවාස සඳහා රජයේ තක්සේරුකරුගේ ආර්ථික කුලිය ලබාගැනීමකින් තොරව මාසිකව රු.400 සිට සහ රු.750 අතර අවම කුලී මුදලක් අය කිරීමට කටයුතු කර තිබුණි.	බැවින් විශ්වවිද්‍යාල නිවාස කමිටුවේ තීරණය ප්‍රකාරව නිවාස කුලී අය කර ගැනීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දැනුම් දී ඇත. කෙසේ නමුත් විගණන විමසුමෙන් පසු නව පාලක සභාව විසින් මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් නැවත පැහැදිලි කිරීමක් ලබාගෙන ඒ සම්බන්ධ තීරණයක් ගැනීමට කටයුතු කරනු ලබන බව.	
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	(i) මුදල් රෙගුලාසි 507 (2) හා 11 වැනි පරිශිෂ්ඨය	2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. මිලියන 16,849 ක් වූ ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.	විවිධ හේතු මත මෙම කටයුත්ත ප්‍රමාද වී ඇත. කෙසේ නමුත් 2025 වර්ෂය තුළ නිම කිරීමට සැලසුම් කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුය.
	(ii) මුදල් රෙගුලාසි 570 සහ 571	වර්ෂ 02 සිට 04 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන එකතුව රු මිලියන 1.69 ක් වූ ලංසු තැන්පතු හා වර්ෂ 02 සිට 14 දක්වා කාලයක සිට පැවත එන එකතුව රු.මිලියන 51.51 ක් වූ කොන්ත්‍රාත් හා විවිධ රැඳවුම් මුදල් සම්බන්ධයෙන් යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	නැවත ගෙවිය යුතු ලංසු තැන්පතු ගෙවීමට ඉල්ලීම් කිරීමට දැනුම් දුන්නද ලදුපත්වල මුල් පිටපත් ආදිය නොමැතිකමින් ගෙවීමට ඉදිරිපත් නොවන බව.	-එම-
	(iii) මුදල් රෙගුලාසි 756 (6)	2023 සහ 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2025 ජුනි වන විටත් නිමකර වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	සේවක හිඟතාවය හේතුවෙන් භාණ්ඩ සමීක්ෂණ නිසි වෙලාවට සිදු කිරීමට නොහැකි වී ඇත. කෙසේ නමුත් එම වාර්තා හැකි ඉක්මනින් ලබාදීමට කටයුතු කරනු ලබන බව.	-එම-

(ඊ)	උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 ඡේදය	අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම් හා පිටවීම් තහවුරු කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 1571.3 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි.	මෙය වසර ගණනාවක් තිස්සේ විමසුම් කරන කාරණයක් වන අතර, විශ්වවිද්‍යාල පද්ධතියේම මේ ආකාරයට පවතින බව.	උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.
(උ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 5 වන ඡේදය	බැඳුම්කර ගිවිසුම් කඩකිරීම මත අයකර ගත් රු.මිලියන 52.9 ක් භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	බැඳුම්කර ගිවිසුම් කඩකිරීම සම්බන්ධව මුදල් පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් චක්‍රලේඛ කිහිපයක් නිකුත් කර ඇත. එම චක්‍රලේඛ අනුව විශ්වවිද්‍යාලය විසින් කටයුතු කර ඇති බව.	භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.
(ඌ)	විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.10 ඡේදය	පර්යේෂණ අත්තිකාරම් දින 90 ක් තුළ පියවිය යුතු වුවත් කථිකාචාර්යවරුන් 11 දෙනෙක් වෙත ලබාදී තිබූ එකතුව රු. මිලියන 1.158 ක් වූ අත්තිකාරම් ලබා දී වර්ෂ 01 සිට 15 දක්වා කාල පරිච්ඡේදයක් ගත වී තිබුණද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	විගණනය විසින් සඳහන් කර ඇති කථිකාචාර්යවරුන් 11 දෙනාගෙන් දෙදෙනෙකු හැර ඉතිරි 09 දෙනාම මේ වන විට ලබාගත් අත්තිකාරම් මුදල් පියවා ඇත. නොපියවූ දෙදෙනාගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව.	විශ්වවිද්‍යාලයේ පර්යේෂණ ප්‍රදාන සම්බන්ධ මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(එ)	උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහයේ v පරිච්ඡේදයේ 7.6.1 සහ 7.6.2 ඡේද සහ 2022 ජුනි 22 දිනැති අංක 02/2022 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණන චක්‍රලේඛය	කථිකාචාර්යවරුන් 27 දෙනෙකු හා වෙනත් නිලධාරීන් දෙදෙනෙකු විසින් කඩකර තිබුණු රු. මිලියන 257.472 ක බැඳුම්කර වටිනාකම අදාළ නිලධාරියාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.	බැඳුම්කර කඩකර ඇති නිලධාරීන්ගෙන් මුදල් අයකර ගනිමින් පවතින බව.	උසස් අධ්‍යාපන ආයතන සඳහා වන ආයතන සංග්‍රහය සහ අදාළ චක්‍රලේඛවල විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අදාළ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

1.7 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2023 අප්‍රේල් 6 දිනැති අංක SEC/2023/E/02 දරන චක්‍රලේඛයේ 3 ඡේදය සහ 2023 ජූලි	මෙය සෑම විශ්වවිද්‍යාලයකම අනුගමනය කරන ක්‍රමය වන අතර මේ සම්බන්ධයෙන්	දේශීය ආදායම් පනත සහ චක්‍රලේඛ

18 දිනැති අංක SEC/2023/02 දරන චක්‍රලේඛයේ 4 ඡේදය ප්‍රකාරව සේවා නියුක්තික ආදායම මත ගෙවිය යුතු අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) ගණනය කිරීමේදී විශ්වවිද්‍යාලය විසින් ඉන්ධන හා ප්‍රවාහන දීමනාවෙන් සියයට 75 ක් සැලකිල්ලට නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් 11 දෙනෙකුගෙන් රු.මිලියන 2.58 ක උපයන විට බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් දේශිය ආදායම් කොමසාරිස් වෙත ලිපියක් යොමු කර ඇත. මේ සඳහා පැහැදිලි තීරණයක් ලැබෙන තෙක් මේ ආකාරයට ගණනය කරනු ලබන බව.	විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.171,988,597 ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.274,616,654 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.102,628,057 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට භාණ්ඩාගාර වර්තන ප්‍රදාන රු.233,060,000 කින් හා ප්‍රාග්ධන ප්‍රදාන රු.244,778,292 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ ආකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
හෙක්ටයාර් 48.7 ක් වූ ඉඩම් 6 ක නිත්‍යානුකූල අයිතිය 2025 ජූනි වන විටත් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට අපොහොසත් වී තිබුණි.	ඉඩම් පවරා ගැනීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධීකරණය වී කටයුතු සිදුකරමින් පවතින බව.	කඩිනමින් විශ්වවිද්‍යාලය වෙත පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
1998 වර්ෂයේදී රාජ්‍ය පොහොර සමාගමට අයිතිව තිබුණු අක්කර 15 ක ඉඩමක් 2011 වර්ෂයේ දී රු.මිලියන 48 කට තක්සේරු කර විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨය සඳහා පවරා ගැනීමට 2013 වර්ෂයේ දී කටයුතු ආරම්භ කර තිබුණි. එසේම ඉඩම පවරා ගැනීම සඳහා රු.මිලියන 239.6 ක් වැය කර ඉන් අක්කර 09 ක් පමණක් පවරා ගෙන 2024 දෙසැම්බර් 31 දින වන විට කාර්ය මණ්ඩලය	අදාළ මුදල් කොටස් වශයෙන් ලැබීම හේතුවෙන් වන්දි පොලී ගෙවීමට සිදු වී ඇත. මෙම ඉඩමේ අයිතිකරු විසින් ලබා දීමට එකඟ වී ඇති ඉඩම් කොටස් කීපයක් පමණක් ලබා ගැනීමට එකඟ වී ඇති අතර ,අදාළ ඉඩමේ තක්සේරුව රජයේ තක්සේරුකරුවන් විසින් සිදු කර ඇත .මෙම වන්දි මුදල් ගණනය කර ඇත්තේ මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් වන අතර, අදාළ ගණනය කිරීම් අනුව වන්දි මුදල් ගෙවා ඇත.මෙම ඉඩම පවරාගැනීමේ අරමුණක් වූයේ කෘෂි පීඨයේ අධ්‍යයන කටයුතු පවත්වාගෙන යාමයි. ඒ සඳහා නිසි ප්‍රවේශ මාර්ග සහ පීඨය තුළ	විධිමත් පරීක්ෂණයක් සිදුකර වගකිව යුතු නිළධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය.

	සඳහා නිල නිවාස ඉදිකිරීමේ කාර්යය පමණක් ඉටුකර ගෙන තිබුණි. විශ්වවිද්‍යාලය විසින් ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමකින් තොරව කඩිනමින් ඉඩම් පවරා ගැනීම සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ පනත ප්‍රකාරව 38 (අ) අතුරු විධානය නිකුත් කිරීම සහ වන්දි ගෙවීම ප්‍රමාද වීම මත රු. මිලියන 55.56ක වන්දි පොලියක් ගෙවීමටද සිදු වී තිබුණි. තවද, ඉඩම පවරාගැනීම වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 5.29 ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු නොකර විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලට බැර කර තිබුණි.	දැනට තිබෙන ගොවිපළ ඉඩමෙන් පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව තිබිය යුතු ය. එසේම ජල මූලාශ්‍ර පිහිටීම ඉතා වැදගත් සාධකයකි. එබැවින් ඉඩමේ වාණිජ වටිනාකමට වඩා ඉහත අරමුණු වෙනුවෙන් මෙම ඉඩමේ තෝරාගත් කොටස මිලදී ගැනීමට කටයුතු කර ඇත.රජය මගින් අත්පත් කර ගත් මෙම ඉඩමේ භුක්තිය භාර දීම ඉඩමේ හිමිකරු විසින් ප්‍රතික්ෂේප ඇති බව දිසාපති වෙත ප්‍රදේශීය ලේකම් විසින් දන්වා ඇත. ඉන් පසු ඒ සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන මෙන් 2014 ජනවාරි 22 දින අනුරාධපුර මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ටාර් වෙත දන්වා ඇත. මෙම කාලය තුළ අදාළ ඉඩමේ හිමිකරු විසින් අක්කර 15ක පමණ වූ ඉඩමෙන් අක්කර 9ක පමණ කොටසක් ලබා දීමට එකඟතාවය පළකරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දන්වා ඇත. මේ පිළිබඳ විශ්වවිද්‍යාලයේ එකඟතාවය විමසීමෙන් පසු, පාලක සභාව විසින් යෝජිත ඉඩම් කොටස කෘෂිකර්ම පීඨය පුළුල් කිරීමට ප්‍රමාණවත් බව තීරණය කිරීමෙන් පසු එම කොටස අත්පත් කර ගැනීමට කටයුතු කර ඇත. එම පාලක සභා තීරණය අනුව උපකුලපතිතුමාගේ 2014 පෙබරවාරි 25 දිනැති ලිපිය මගින් අධිකරණ ක්‍රියාමාර්ග තාවකාලිකව අත්හිටුවන මෙන් මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇත. විශ්වවිද්‍යාල අරමුදලට ලද මෙම මුදලින් ඉතිරි වූ රු. මිලියන 5.29 ක මුදල විශ්වවිද්‍යාල සංවර්ධන අරමුදලේ රඳවා තබා ඇති බැවින් මෙම ගිණුමට මාරු කිරීමට කටයුතු කල බව.	

3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

	විගණන නිරීක්ෂණ	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉදිකිරීම් කටයුතු 2021 ඔක්තෝබර් 31 දින වන විට අවසන් කළ යුතුව තිබූ කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 356.32 ක් වූ තාක්ෂණ පීඨ ගොඩනැඟිල්ලේ අදියර II සහ III ගිවිසුම් ප්‍රකාරව අවසන් කිරීමකින් තොරව 2024 නොවැම්බර් 25 දින සිට අත්හැර දමා තිබුණි. එහෙත් පිළිවෙලින් රු.මිලියන 71.26 ක් හා රු.මිලියන 17.81 ක් අත්තිකාරම් හා කාර්යසාධන සුරක්ෂණ කල් ඉකුත් වීමට පෙර මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතිය අන්‍යෝන්‍ය එකඟතාවය මත ඇවර කිරීම සඳහා යොමු කර ඇති අතර කොන්ත්‍රාත්කරු විසින් මේ වන විට අදාළ ලියකියවිලි ලබා දීම සිදුකරගෙන යනු ලබයි.අදාළ කොන්ත්‍රාත්කරු විසින් අත්තිකාරම් හා කාර්යසාධන සුරක්ෂණ දීර්ඝකර විශ්වවිද්‍යාලය වෙත ලබා දී ඇති බව.	අත්තිකාරම් සහ කාර්යසාධන සුරක්ෂණ කඩිනමින් මුදල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	2019 නොවැම්බර් මාසයේදී රු.මිලියන 156.56 ක කොන්ත්‍රාත් වටිනාකමට විශ්වවිද්‍යාල නේවාසිකාගාර සඳහා	මෙම කොන්ත්‍රාත්තුව පැවැති කොරෝනා වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් ප්‍රමාද විය. මෙම	ගිවිසුම් ප්‍රකාරව නියමිත කාලය තුල සියළු උපාංග

මළාපවහන සහ අපජල පිරිපහදු කිරීමේ පද්ධතියේ ඉදිකිරීම් කටයුතු වර්ෂයක කාලයක් තුළදී නිම කිරීමට ගිවිසුම් ගත වී වසර 05 කට අධික කාලයක් ගත වී තිබුණද විගණිත දිනය වූ 2025 මැයි 30 දින වන විටත් අවසන් කර නොතිබුණි. ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් හා පිරිවිතර ප්‍රකාරව කටයුතු නොකිරීම සහ නේවාසිකාගාරවල සිටින ශිෂ්‍ය ප්‍රමාණයන් නිවැරදිව හඳුනාගෙන පද්ධතිය සැලසුම් නොකිරීම හේතුවෙන් රු.මිලියන 185.94 ක් වැය කර ඉදිකරමින් පවතින මෙම පද්ධතියේ අපජලය, පිරිපහදු කිරීමේ ටැංකිවලින් උතුරා යන බව නිරීක්ෂණය විය. තවද පද්ධතියට සවිකල යුතු අකුණු සන්නායකය විගණිත අවස්ථාව වන විටත් සවිකර නොතිබුණි.	ව්‍යාපෘතියේ ඇති ඉතිරි අවශේෂ වැඩ කටයුතු සියල්ලක්ද මේ වනවිට කොන්ත්‍රාත්කරු විසින් නිම කර තිබේ.විශ්වවිද්‍යාලය සතුව අපද්‍රව්‍ය කළමනාකරණ ඒකකයක් පවතින බැවින් ඒ සඳහා මෙම අපද්‍රව්‍ය භාවිතා කළ හැක. විවිධ හේතු මත නේවාසිකාගාර වල සිසුන්ගේ ප්‍රමාණය වැඩි කිරීමට සිදු වූ බැවින් අපේක්ෂිත අපජල පරිමාවට වඩා වැඩි ජල පරිමාවක් Peak Time වල මෙම ඒකකය වෙත ලැබීම සිදු වේ. ඒ අනුව අමතර පිරිපහදු ඒකකයක් සවිකිරීම හා මෙම ඒකකයේ ධාරිතාවය ඉහළ නංවාගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම යන ක්‍රියාමාර්ග මේ වනවිට විශ්වවිද්‍යාලය මඟින් ක්‍රියාවට නංවා ඇති බව.	සහිතව ඉදිකිරීම් කරවා ගත යුතු අතර ශිෂ්‍ය නේවාසිකාගාරවල ධාරිතාවයට සරිලන පරිදි අවශ්‍ය වෙනස්කම් සිදුකර ව්‍යාපෘතිය ඵලදායීව හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත වත්කම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විදේශ ව්‍යාපෘතියක් වූ Accelerating Higher Education Expansion & Development Operation (AHED) ව්‍යාපෘතිය යටතේ කළමනාකරණ අධ්‍යයන පීඨයේ රු.මිලියන 1.59 ක වියදමින් ස්ථාපිත කර තිබුණු පරිගණක මෘදුකාංග පද්ධතිය, මානව ශාස්ත්‍ර පීඨයේ නවීකරණය කරන ලද විද්‍යාගාරය හා රු.මිලියන 10.36 ක් වැය කර සවිකර තිබුණු වායුසමීකරණ සහ පරිගණක යන්ත්‍ර ඇතුළු උපකරණ 2023 වර්ෂයේ සිට ඌන උපයෝජිතව හා නිෂ්කාර්යයව පැවතුණි. තවද රු. මිලියන 19.75 ක් වැය කර සැපයුම්කරුවන් තිදෙනෙකුගෙන් පිරිවිතර වලට පටහැනිව බල ශක්ති කාර්යක්ෂම ඉන්වර්ටර් වර්ගයේ වායු සමීකරණ නොවන යන්ත්‍ර 96 ක් මිලදී ගෙන තිබුණි. ඉන් එක් සැපයුම්කරුවෙකු රු.මිලියන 8.03 කට වායුසමීකරණ යන්ත්‍ර 53 ක් සැපයීම සඳහා එකඟ වී තිබුණද ඉන් යන්ත්‍ර 20 ක් පමණක් සපයා තිබියදී රු.805,000 ක් වන කාර්යසාධන සුරක්ෂණය මුදල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම මෘදුකාංගය 2022 දක්වා භාවිතා කරන ලදී. පසුව විවිධ හේතු මත මෘදුකාංගයේ බලපත්‍රය අළුත් නොකිරීමට තීරණය කරන ලදී. 2024 වර්ෂයේ අගභාගයේ සිට මෙම පරිගණක විද්‍යාගාරය දේශන සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා යොදාගෙන ඇත. 2022 වර්ෂයේ සිට මේ දක්වා මිලදී ගනු ලැබූ සියළු වායුසමීකරණ යන්ත්‍ර ඉන්වර්ටර් වර්ගයේ ඒවා විය. ඊට පෙර ඉන්වර්ටර් වර්ගයේ වායුසමීකරණ යන්ත්‍ර මිලදීගෙන නොතිබුණි.ගිවිසුම් ප්‍රකාරව අදාළ ආයතනය විසින් වායුසමීකරණ යන්ත්‍ර 53 ක් සාර්ථක ලෙස සවිකර ඇත. ඒ අනුව කාර්යසාධන සුරක්ෂණ මුදල් කරගැනීමේ අවශ්‍යතාවයක් නොමැති බව.	වත්කම් ඵලදායීව හා කාර්යක්ෂමව භාවිතයට ගැනීමට කටයුතු කළ යුතු අතර අදාළ සැපයුම්කරු ගිවිසුම් ප්‍රකාරව සැපයුම සිදුකර නොමැති විට කඩිනමින් කාර්යසාධන සුරක්ෂණය මුදල් කර ගැනීමට කටයුතු කළ යුතුය. තවද ලබා දී ඇති ඇතැම් පිළිතුරු සාවද්‍ය බැවින් මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

04. **ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය**

4.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 1/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මඟින් හඳුන්වා දී තිබූ රාජ්‍ය ව්‍යාපාර පාලනය සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2025 මැයි 16 දින එනම් දින 77 ක ප්‍රමාදයක් සහිතව ඉදිරිපත් කර තිබුණි.	සේවක හිඟය හේතුවෙන් මෙම තත්ත්වය ඇති වී ඇත. ඉදිරියේදී නියමිත පරිදි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව.	චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.